# වැඩ බැරි දාස ගැන කතා

2

නිකොලායි නෝසව්



# වැඩ බැරි දාස
## සංගීත කාරයෙක් වුණු හැටි



සී/ස ප්‍රෝග්‍රෙසිව් පබ්ලිෂිං හවුස් (පුද්.) සමාගම

# වැඩ බැරි දූස ගැන කතා

## නිකොලායි නෝසව් 2

# වැඩ බැරී දූස

අනුවාදය - දැදිගම වී. රුද්‍රිගු

චිත්‍ර - බරිස් කලෞෂින්

නව පරිගණක සකැසුම - මාලක ලලනජීව

නව මුද්‍රණය 2017



ප්‍රෝග්‍රෙසිව් පබ්ලිෂින් හවුස්





වැඩ බැරි දාස මොකක් හරි වැඩක් බාර ගත්තොත් අනික් ළමයින් වගේ නොවේ, එය කන පිටට තමයි කරන්නේ. එයාට වචනයක් එකපාරට කියවන්ට බැහැ. අකුරු දෙක තුන වෙන් කරලා තමයි කියවන්නේ. ලියන්නේ පොල් ගෙඩි තරම් ලොකු අකුරු. වැඩ බැරි දාසගේ ඔළුව පුස්සක් කියලා බොහෝ දෙනෙක් කිව්වා. ඒ කතාව හරි නැහැ. එයාගෙ ඔළුව පුස්සක් නම්, එයා කල්පනා කරන්නේ කොහොමද? සත්තකින්ම එයාගෙ කල්පනා ශක්තිය බොහොම දුර්වලයි. ඒ වුණාට එයා සපත්තු දෙක ඔළුවේ දමා ගන්නේ නැතුව දෙපයේ දා ගත්තා. ඉතින් එහෙම කරන්නත් කල්පනා ශක්තියක් තියෙන්න ඕන.

වැඩ බැරි දාස මෝඩ ළමයෙක් නොවෙයි. එයා බොහොම කැමතියි මොනව හරි ඉගෙන ගන්න. නමුත් එයා කැමති නැහැ මහන්සි වීමට. ඕනෑම දෙයක් එක පාරටම ඉගෙන ගන්න එයාට වුවමනා කළා. කොච්චර නුවණ තියෙන දක්ෂ ළමයකුට වුණත්, කිසිම දෙයක් එක වර ඉගෙන ගැනීමට බැහැ.





පුංචි ළමයි, සිඟිත්තෝ සංගීතයට බොහොම කැමතියි. කුසල් බොහොම දක්ෂ සංගීත කාරයෙක්. එයා ළඟ සංගීත භාණ්ඩ ගොඩක් තියෙනවා. එයා නිතර, නිතර ඒ සංගීත භාණ්ඩ වාදනය කරනවා. මිනිස්සු ඔහුගේ සංගීත වාදනය අසලා ඔහුට ප්‍රශංසා කළා. මේ නිසා වැඩ බැරි දාස කුසල්ට ඉරිසියා කළා. එයා කුසල්ට මෙහෙම කිවුවා:

"මම කැමතියි සංගීත කාරයෙක් වෙන්න. මටත් උගන්වන්න."

"ඔයා කැමති මොනවාට ද?"

"ඉගෙන ගන්න වැඩියෙන් ම ලෙහෙසි සංගීත භාණ්ඩයට."







"එහෙනම් බැලලයිකාව"


"මෙහෙ දෙන්න. මම බැලලයිකා වාදනය පුරුදු වෙන්නම්"

කුසල් ඔහුට බැලලයිකාව දුන්නා. වැඩ බැරි දාස එහි තත් කිහිපයක් හඬ නංවා මෙහෙම කිව්වා.

"මේ බැලලයිකාවෙ හඬ බොහොම මදි. වැඩිය සද්ද තියෙන සංගීත භාණ්ඩයක් ඕන."







එවර කුසල් ඔහුට වීණාවක් දුන්නා. වැඩ බැරි දාස උපවීණය අතට අරගෙන වීණාවෙ තත් මදින්නට වුණා.


"අපෝ, මීට වඩා සද්දෙ තියෙන සංගීත භාණ්ඩයක් නැද්ද?"

"බෑන්ඩ් නළාව තියෙනවා" කුසල් කිව්වා.

"එහෙනම් මට දෙන්න. මම නළාව පිඹින්නම්"

එවිට කුසල් මහා විශාල තඹවන් නළාවක් වැඩ බැරි දාසට දුන්නා. ඔහු නළාව පිම්බා විතරයි, එයින් මහා හඬක් පිට වුණා.

"ඔන්න ඉතාම හොඳ සංගීත භාණ්ඩය. බොහොම සද්දෙ තියෙනවා" එහෙම කිවුවෙ වැඩ බැරි දාස.





"ඉතින් ඔයාට ආසයි නම් ඉගෙන ගන්න!" කුසල් කිව්වා.

"මම ඉගෙන ගන්නේ මොකටද? මට වාදනය කරන්න පුළුවනි," වැඩ බැරි දාස පිළිතුරු දුන්නා.

"ඔයාට වාදනය කරන්න තවම බැහැ. ඉගෙන ගන්න ඕන."

"අපොයි, මට පුළුවනි!" වැඩ බැරි දාස එහෙම කියලා මහ හඬින් නළාව පිම්බා.

"පම්-පම්-පම්! පුම්-පුම්-පුම්!"

"ඔයා නිකම් නළාව පිඹිනවා විතරයි. වාදනය කරන්නේ නැහැ."

"වාදනය කරන්නේ නැතිද? හොඳට වාදනය කරනවා. හොඳ සද්දෙට වාදනය කරනවා." එහෙම කිව්වෙ වැඩ බැරි දාසය.

"සද්ද කිරීම නොවෙයි හපන්කම. ලස්සනට වාදනය කිරීමයි" කුසල් විස්තර කළා.

"ඉතින් මම ලස්සනට වාදනය කරනවා නේන්නම්"

"කොහෙත්ම ලස්සන නැහැ. ඔයාට සංගීත වාදනයට දක්ෂතාවයක් නැති බව මට පේනවා," කුසල් කිව්වා.

"වාදනය දන්නේ නැත්තේ නුඹයි! නුඹ මට ඉරිසියා කරන නිසා එහෙම කියනවා. නුඹ කැමතියි නුඹේ වැදනය විතරක් අහලා නුඹට විතරක් හොඳ කියනවට." වැඩ බැරි දාසට තරහ ගිහිල්ලා එයා කුසල්ට බැන්නා.

"ඔයා කැමති නම් ඕන තරම් නළාව පිඹින්න. ඉගෙන ගන්න ඕන නැති නම්, ඒක ඔයාගෙ වැඩක්. මිනිස්සු ඔයාට හොඳ කියනවට මම කැමතියි," කුසල් කලබල නොවී කිව්වා.

"ඔව්, මම වාදනය කරනවා!" වැඩ බැරි දාස ආඩම්බරයෙන් උත්තර දුන්නා.





ඉතින් එයා නලාව පිඹින්න පටන් ගත්තා. එයා වාදනය කරන හැටි ඉගෙන ගත්තෙ නැති හන්දා ඒ නලාවෙන් කනට බොහොම අමිහිරි ශබ්ද පිට වුණා. එක වෙලාවකට නලාව ගොරවනවා, තවත් වෙලාවකට නහයෙන් අඬනවා, නැතිනම් ඌරකු වගේ ගොර-ගොර ගානවා. කුසල්ට මේ කරදරය අහගෙන ඉන්න බැරි නිසා ඔහු කබාය ඇඟ ලා ගෙන, ටයි පටිය වෙනුවට රෝස පාට පීත්ත පටිය කරේ බැඳගෙන යාළුවන් හමු වීමට ගියා.

හවස ළමයින් ඔක්කොමල්ලා එක්කහු වුණාම වැඩ බැරි දාස නලාව පිඹින්න පටන් ගත්තා.

"බුම්-බුම්-බුම්!.. පුම්-පුම්-පුම්!.."

"මේ සද්දෙ මොකක්ද?" ළමයි ඇහුවා.

"සද්දයක් නොවෙයි. මම වාදනය කරනවා" වැඩ බැරි දාස පිළිතුරු දුන්නා.

"ඕක කන්දොස්කිරියාවක් නවත්තනවා! අපේ කන් අඩි රිදෙන්න පටන් අරගෙන," දක්ස පාල කිව්වා.

"එහෙම රිදෙන්නෙ නුඹල මගේ සංගීතයට පුරුදු නැති හන්දා. පුරුදු වුණාම වේදනාව නැතිව යාවි."

"ඔය කන්දොස්කිරියාව උහුලාගෙන ඉන්න මට බැහැ"

වැඩ බැරි දාස ළමයින්ගේ අසතුට ගණන් ගන්නේ නැතුව දිගටම නලාව පිම්බා.

"බුම්-බුම්-බුම්!.. පුම්-පුම්!.."





"ඔය පිස්සු වැඩ නවත්තනවා! එහෙම බැරි නම් නළාවත් අරගෙන කරුණාකරලා යන්න!" ළමයි සියලු දෙනාම වැඩ බැරි දාසට කිව්වා.

"මම කොහේ යන්න ද?"

"පාළු පිට්ටනියට ගිහිල්ලා පිඹින්න"

"මගේ වාදනය අහන්න එතන ළමයින් නැහැ."

"ඔයාගේ කන්දොස්කිරියාව අහන්නම ඕන ද?"

"සත්තකින්ම අහන්න කවුරු හරි ඉන්න ඕන," වැඩ බැරි දාස කිව්වා.

"එහෙනම් මහ පාරට ගිහිල්ලා පිඹින්න. මහ පාරෙ යන මිනිස්සු අහාවි."

වැඩ බැරි දාස මහ පාරට ගිහිල්ලා ගෙයක ජනේලය ළඟ හිටගෙන නළාව පිම්බා. කරදර නොකර වෙනින් තැනකට යන්නයි කියලා වැඩ බැරි දාසට ඒ ගෙදර මිනිස්සු කිව්වා. එතකොට එයා ඊළඟ ගෙදර අසලට ගිහිල්ලා නළාව පිම්බා. ඒ ගෙදර මිනිස්සුත් වැඩ බැරි දාසව පන්නා ගත්තා. එවර එයා තුන්වැනි ගෙදර ළඟටත් ගිහිල්ලා නළාව පිම්බා. ඒ ගෙදර මිනිස්සුත් එයාව එළවා දැම්මා. එවිට වැඩ බැරි දාසට කේන්ති ගිහිල්ලා තවත් හයියෙන් නළාව පිඹින්න පටන් ගත්තා. ඉතින් මේක මහා ලොකු කරදරයක්. ඒ ගෙවල්වල ඉන්න මිනිස්සු මහ පාරට ඇවිල්ලා නළාව පිඹින කරදරකාරයාව ඈතට පන්නා දැම්මා. වැඩ බැරි දාස නළාවත් අරගෙන පණ බේරාගෙන දුවලා ගියා.



ඔන්න ඉතින් එදා ඉඳලා වැඩ බැරි දාස නළාව පිඹීම අතහැරලා දැම්මා.

"මේ ගොල්ලන්ට මගේ සංගීත වාදනය තේරුම් ගන්න බැහැ. මේ මෝඩ මිනිස්සු එතරම් තවම දියුණු වෙලා නැහැ. දියුණු වුණාම මගෙන් ඉල්ලා හිටිවි වාදනය කරන්නයි කියලා. එතකොට පමාවෙලා. මම මීට පස්සෙ නළාව වාදනය කරන්නේ නැහැ."







වැඩ බැරි දාසගේ හපන්කම් ගැන තව දුරටත් ඔබ දැන ගැනීමට කැමති නම්, කුසුම් පුරයේ වැසියන් පිළිබඳ තොරතුරු ඔබට විවිධ කතා මගින් දැනගත හැකි ය. වැඩ බැරි දාස චිත්‍ර ශිල්පියෙක් වුණු හැටි, වැඩ බැරි දාස කවි ලියූ හැටි.

ISBN 978-955-1319-57-1

9 789551 319571

LKR 200/-

සී/ස ප්‍රෝග්‍රෙසිව් පබ්ලිෂිං හවුස් (පුද්) සමාගම
91, ආචාර්ය ඇන්. ඇම්. පෙරේරා මාවත, කොළඹ 08